# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1367/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 23/08/2024 පැය 1435

**මාධ්‍ය නිවේදනය**

**අති පූරාණ ශ්‍රී පත්තිනි දේවාල මහා පෙරහර හේතුවෙන් වාහන ගමනාගමනය සීමා කිරීම - නවගමුව පොලිස් වසම.**

නවගමුව පොලිස් වසමේ අති පූරාණ ශ්‍රී පත්තිනි දේවාලයේ මහා පෙරහර මංගල්‍ය අවිස්සාවේල්ල කොළඹ 143 පරණ පාරේ පහත පරිදි වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

**දිනය හා වේලාව : 2024.08.24 රාත්‍රී 08.00 - අළුයම 02.00 දක්වා.**
**2024.08.25 උදෑසන 08.00 - දහවල් 01.00 දක්වා.**

ඉහත කාලය තුල අවිස්සාවේල්ල කොළඹ 143 පරණ පාර මාර්ගය භාවිතා කරන මහජනතාව සහ රියදුරන්ගෙන් පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග**

- අවිස්සාවේල්ල - කොළඹ 143 මාර්ගය ඔස්සේ ධාවනය වන වාහන රණාල සියඹලාගස් හන්දියෙන් වමට හරවා 698 මාර්ගය ඔස්සේ ඔරුවල හන්දියට ගොස් ඔරුවල හන්දියෙන් දකුණට හරවා 697 මාර්ගය ඔස්සේ වෙලේ හන්දියට පිවිස කොළඹ දෙසට ගමන් කල හැක.

- කොළඹ දෙස සිට හංවැල්ල දෙසට 143 මාර්ගයේ ධාවනය වන වාහන වෙලේ හන්දියෙන් දකුණට හරවා 697 මාර්ගයේ ගොස් ඔරුවල හන්දියෙන් වමට හරවා රණාල සියඹලාගස් හන්දියෙන් දකුණට හැරී හංවැල්ල දෙසට ධාවනය කල හැක.

ඉහත නිවේදනය මහජනතාවගේ සහ රියදුරන්ගේ දැන ගැනීම සඳහා ඔබ මාධ්‍ය මඟින් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.